# අනුරාධපුර යුගයේ කලා කෘති සඳහා බලපෑ හස්ති සංකල්පය හා ඉන් හෙළිවන සමාජ සංස්කෘතික නිරූපිතය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යයනයක්

තුෂීර කේ.එස්., මධුෂාන් යූ.ඩී.එස්. සහ හර්ෂණ පී.එල්.සී.

මානවශාස්ත්‍ර අධ්‍යනාංශය, ශ්‍රී ලංකා රජරට විශ්වවිද්‍යාලය
shehanthushira@gmail.com

**සාරසංක්ෂේපය**

අනුරාධපුර යුගයේ කලා කෘති සඳහා උපයෝගිත හස්ති සංකල්පය පිළිබඳව විමර්ශනාත්මක අධ්‍යනයක් මෙහිදී සිදු කෙරේ. අනුරාධපුර රාජධානි සමයේ දී කලා කෘති සඳහා භාවිත හස්ති සංකල්පය තුළින් හෙළිවන සමාජ සංස්කෘතික නිරූපිතය හඳුනා ගැනීම මෙම පර්යේෂණයේ අරමුණ විය. අනුරාධපුර යුගයේ දී සමාජ සංස්කෘතික නිරූපිතයක් ලෙස කලා කෘති උදෙසා හස්ති සංකල්පය භාවිතයේ උපයෝගීතාවය කෙබඳු ද යන්න මෙහි පර්යේෂණ ගැටලුව වේ. මෙහිදී අධ්‍යයන ක්‍රමවේදය වශයෙන් පුස්තකාල අධ්‍යයනය සිදු කෙරිණි. පෙරදිග සංස්කෘතිය තුළ සුබ සලකුණක් ලෙස ඇත් සංකේතය යොදා ගෙන ඇත. සුරාසුර යුද්ධයේදී කිරි මුහුද කලඹනවිට හමුවන සිතු පැතූ වස්තූන් දෙන වස්තූන් අතර 'අයිරාවන' එක් වස්තුවකි. අයිරාවන යන්නෙහි තේරුම ජලයෙහි වසන්නා යන්නයි. ඒ නිසා ඇතා ජලය සංකේතවත් කිරීම සඳහා පසුකාලීන කෘතිවල දැකිය හැකිය. රන්මසු උයන හා ඉසුරුමුණියේ පොකුණු ආශ්‍රිතව ඇත් සංකේතය නිරූපණය කර ඇත. බෞද්ධ විහාරවල පෙරහැර චාරිත්‍ර සිදු කිරීමේ දී කාල වර්ණ මේඝ සංකේතවත් කිරීම සඳහා හස්තියා යොදා ගෙන ඇත. පුරාණ ජාතක කතා අතර වෙස්සන්තර, ඡද්දන්ත ජාතක කතාවල ඇතාව වර්ණනා කර තිබේ. ඇලි ඇතා වර්ෂාව ලබාදීමට හැකි සත්ත්වයකු බව පෙරදිග සභ්‍යත්වය තුළ ප්‍රචලිතය. උක්ත ජාතක කතාවන්හී සඳහන් වන්නේ ද ඇලි ඇතුල් දෙදනකු පිළිබඳවයි. දුටු ගැමුණු කුමරු උපත ලද දිනයේ දී ඇතින්නක් තම පැටවාවව රජ මාළිගාව අසල දමා ගිය බව වංශ කතා සඳහන් කරයි. ඉන් ගැමුණු කුමරුගේ උපත සුබ කටයුත්තක් සේ සැලකීමට උත්සාහ ගත්තා වන්නට පුලුවන. 'නාග' යන නම ද ඇතාට යෙදෙන පර්යාය පදයකි. උපසම්පදා අපේක්ෂකයාව හඳුන්වනු ලබන්නේ ද ඇතා හෙවත් නාග යන නමිනි. මුළු බුද්ධ ධර්මයම ඇත් පාද සලකුණකට සමාන කර දක්වන්නේ චුල්ලහත්තිපදෝපම සූත්‍රයේදී ය. සිද්ධාර්ථ කුමාරෝපත්තිය දක්වන තැන බාර්හුත් කැටයම්හී මහාමායා දේවියගේ කුසට ඇතුල් වන්නේ සුදු ඇත් පැටවෙකි. අශෝකගේ ධෞලිගිරි ලිපියේ ද, ගිර්නාර් ලිපියේ ද නාග යන වචනය යොදමින් බුදුන් හා සමකොට පෙන්වයි. දළඳාව වැඩමවීමට මංගල හස්තිරාජයා යෙදවීමත්, රජකමට සුදුසු කුමාරයකු තෝරා ගැනීමේ දී මංගල හස්තිරාජයා දණ නැමූ පුද්ගලයා තෝරා ගැනීමත් ඇතාට හිමි සුබ තත්වය තේරුම් කරයි. අශෝක කුළුණුවල එක් දිශාවක් වෙනුවට යොදන්නේ හස්තියාය. හින්දු ආගමේ ලෝකය ඔසවාගෙන සිටින සත්ත්වයින් ලෙස හඳුන්වන්නේ දිග්ගජ ලෙසින් හඳුන්වන ඇතුන් සිව් දෙනෙකි. ඒ නිසා අනුරාධපුර යුගයේ කලා කෘති උදෙසා භාවිත ඇත් සංකේතය පෙරදිග සංස්කෘතිය තුළ සුවිශේෂීත්වයක් හිමිව තිබූ බව පැහැදිලි වේ.

**ප්‍රමුඛ පදඃ** *සුරාසුර, අයිරාවන, නාග, මේඝ, දිග්ගජ*